පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

**පෙරදිග සංගීතය I**

**පැය දෙකයි**

# තෙවන වාර පරීක්ෂණය - 2023
## 12 ශ්‍රේණිය

| 54 | S | II |
|---|---|---|

විභාග අංකය : ..................................

## I පත්‍රය

❖ සියළුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

❖ **1 සිට 30 දක්වා ප්‍රශ්නවලට වඩාත් නිවැරදි පිළිතුර තෝරා එයට හිමි අංකය ඉදිරියේ ඇති වරහන තුළ යොදන්න.**

1. ''රි̊ගු̊රි̊සි̊'' ලෙසින් ගු̊ (උච්ච කෝමල ගාන්ධාරය) විවාදී වන රාගය වනුයේ,

   i. භාගේශ්‍රී　　ii. දේස්　　iii. තිලක්කාමෝද්
   iv. ආසාවරී　　v. ජෞනපුරි　　(　　)

2. |මගු |මධනි |සි̊-|රි̊සි̊සි̊| යන ස්වර පාදයට ගැළපෙන රාගය සහ තාලය පිළිවෙළින්,

   i. භාගේශ්‍රී රාගය - ජප් තාලය　　ii. ආසාවරී රාගය - ඒක් තාලය　　iii. දේස් රාගය - ජප් තාලය
   iv. ජෞනපුරි රාගය - දීප්වන්දි තාලය　　v. තිලක්කාමෝද් රාගය - ත්‍රී තාලය　　(　　)

3. ධ ගු වාදී සංවාදී වන රාග යුගලයකි.

   i. ආසවරී - භෛරවී　　ii. දේස් - ආසවරී　　iii. ආසවරී - ජෞනපුරි
   iv.තිලක්කාමෝද් - දේස්　　v. දේස් - භෛරවී　　(　　)

4. ගාන සමය චක්‍රයට අනුව පෙ.ව. 10.00 සිට ප.ව. 1.00 දක්වා කාලය අයත් වන්නේ,

   i. රාත්‍රී දෙවන ප්‍රහරය　　ii. දිවා තෙවන ප්‍රහරය　　iii. රාත්‍රී ප්‍රථම ප්‍රහරය
   iv.උදයේ ප්‍රථම ප්‍රහරය　　v. දිවා දෙවන ප්‍රහරය　　(　　)

5. ආලප ගායනයේ දී ගීතයේ වචන යොදාගනිමින් කරනු ලබන ආලාප වර්ගය හඳුන්වන්නේ,

   i. ජෝඩ් ආලාප　　ii. බෝල් ආලාප　　iii. නොම්තෝම් ආලාප
   iv. සර්ගම් ආලාප　　v. අකාර් ආලාප　　(　　)

6. හින්දුස්ථානි තාලයක X203 තාල සංඥා යෙදෙන තාල ත්‍රිත්වයක් ඇතුළත් පිළිතුරු වනුයේ,

   i. ජප්තාල්, තිලවාඩා, පංජාබි　　ii. දාදරා, ත්‍රිතාල්, ජප්තාල්　　iii. ත්‍රිතාල්, රූපක්, ඒක්තාල්
   iv. චෞතාල්, ධමාර්, ත්‍රිතාල්　　v. ඒක්තාල්, ධමාර්, ජප්තාල්　　(　　)

7. ධ්‍රැපද් ගායන ශෛලිය සඳහා යොදා ගන්නා හින්දුස්ථානි තාලය වනුයේ,

i. ධමාර් තාලය ii. ත්‍රිතාලය iii. පංජාබ්තාලය

iv. චෞතාලය v. තේවුරා තාලය ( )

8. මීරාභායි, තුල්සිදාස් නාමය හා බැඳී ඇති ගායන ශෛලිය වනුයේ,

i. ගසල් ගායන ශෛලිය ii. භජන් ගායන ශෛලිය iii. ඛ්‍යාල් ගායන ශෛලිය

iv. ධ්‍රැපද් ගායන ශෛලිය v. ධමාර් ගායන ශෛලිය ( )

9. සමගුම, ගුමධ, නිධ, ධ ම යන ස්වර ඛණ්ඩයේ දක්වා ඇති ශිල්පීය අංගයකි.

i. ඛන් ii.ගමක් iii. මීන්ඩ් iv. මූර්කි v. ආන්දෝලන ( )

10. අමීර් කුෂ්රූ විසින් නිර්මාණය කරන ලද, අර්ථ ශූන්‍ය පද වලින් යුතු ගායන ශෛලියකි.

i. ඛ්‍යාල් ගායන ශෛලිය ii. භජන් ගායන ශෛලිය iii.ගසල් ගායන ශෛලිය

iv. චතුරංග ගායන ශෛලිය v.තරනා ගායන ශෛලය ( )

11. රාගධාරී සංගීතයේ දී වාදනයට පමණක් සුවිශේෂී වන ශිල්පීය අංගයකි.

i.තානාලංකාර ii.ජලා iii.ආලාප iv.මීන්ඩ් v.ගමක් ( )

12. විලම්භලය (බඩා ඛ්‍යාල් ) හා මධ්‍යලය (චොටා ඛ්‍යාල් ) සඳහා වඩාත් ගැළපෙන තාල යුගලයක් පිළිවෙළින් දැක්වෙනුයේ,

i. ඒක්තාල් - තිලවාඩා ii. ත්‍රිතාල් - තිලවාඩා iii. තිලවාඩා - ත්‍රිතාල්

iv.පංජාබ් - චෞතාල් v.ධමාර් - චෞතාල් ( )

13. උදාත්ත, අනුදාත්ත, ස්වරිත යනු වෛදික යුගයේ,

i. ස්වර නාම තුනකි. ii. සප්තක තුනකි. iii. ලයෙහි ප්‍රභේද තුනකි.

iv. නාද ස්ථාන තුනකි. v. තාල රූප තුනකි. ( )

14. **තිති නධි නධි නති තින ධින ධින** මෙම පද කොටස්,

i. රූපක් තාලයේ දෙගුණයයි. ii. තබ්ලාවේ හස්ත සාධන අභ්‍යාසයකි.

iii. දීප්චන්දි තාලයේ දෙගුණයයි. iv. මාත්‍රා හතක තබ්ලා අලංකාර පදයකි.

v. ඒක් තාලයේ ඨේකාවයි. ( )

15. අදාරංග, සදාරංග යන නාමය හා බැඳුණු ගායන ශෛලිය වනුයේ,

i. ධ්‍රැපද් ii.ගසල් iii. භජන් iv.තරාණා v. ඛ්‍යාල් ( )

16. පූර්වාංගවාදී රාග යුගලයක් වනුයේ,

i. ආසවරී - දේස් ii. දේස් - තිලක්කාමෝද් iii. භාගේශ්‍රී - ජෞනපුරි

iv. තිලක්කාමෝද් - භාගේශ්‍රී v. ආසවරී - භාගේශ්‍රී ( )

17. ජයජයවන්ති රාගයේ පරමේල ප්‍රවේශක භාවය පෙන්නුම් කරන මේල දෙක පිළිවෙළින්,

i. භෛරව - කාෆි ii. කාෆි - යමන් iii. බිලාවල් - යමන්

iv. ඛමාජ් - කාෆි v. ඛමාජ් - බිලාවල් ( )

18. ථාට සම්බන්ධයෙන් කියැවෙන නිවැරදි ප්‍රකාශය වනුයේ,

i. අවම ස්වර 5 ක් වත් තිබිය යුතු ය. ii. ආරෝහණයක් හා අවරෝහණයක් අත්‍යවශ්‍ය වේ

iii. ස්වර 7 පිළිවෙලින් තිබිය යුතු ය. iv.ගායනය හෝ වාදනය කළ යුතු ය.

v. හින්දුස්ථානි ථාට 10 සකස් කළේ ව්‍යංඛට මුඛී පඬිතුමා ය. ( )

19. රාගධාරී සංගීතයේ දී ශ්‍රැතිය හා තාලය පවත්වා ගැනීමට සුදුසුම භාණ්ඩ යුගලය වනුයේ,

i. තාම්පුරාව - සර්පිනාව ii. තබ්ලාව - වයලීනය iii. හාර්මෝනියම් - තබ්ලාව

iv. තාම්පුරාව - ඩෝලය v. තාම්පුරාව - තබ්ලාව ( )

20. මෝගල් යුගයේ විසූ සංගීතඥයෙකු නොවන්නේ,

i. විෂ්ණු නාරායන භාත්ඛණ්ඩේ පඬිතුමා ii. ව්‍යංඛට මුඛී පඬිතුමා iii. අමීර් කුෂ්රූ පඬිතුමා

iv. සාරංගදේව පඬිතුමා v. මතංගමුණි පඬිතුමා ( )

21. මහනුවර යුගයේ රාජ සභා සංගීතායතනය හා එහි ප්‍රචලිත වූ සංස්කෘතික අංගයකි.

i. නැටුම් ඉලංගම - සවිදම් ii. කවිකාර මඩුව - ප්‍රශස්ති iii. වාහල ඉලංගම - වන්නම්

iv. සිංගාරක්කාර අංශය - ප්‍රශස්ති v. තබ්බෝරුපුරම්පෙට්ටුක්කාර අංශය - හටන් ( )

22. නාඩගම් නාට්‍යයේ අවසර ගැනීම සහ දේවාරාධනය ඇතුළත් අංගය,

i. තෝඩායම ii. ඉන්නිසය iii. උරුට්ටුව

iv. පොතේ සිංදුව v. තර්ගය ( )

23. Flat Note ( ♭ ) 1 ක් පමණක් යෙදෙන ( scale ) ස්කේලය වනුයේ,

i. C Majar Scale ii. G Minor Scale iii. F Majar Scale

iv. B♭ Majar Scale v. E♭ Minor Scale ( )

24. ගද්‍ය හා පද්‍ය කොටස් ඇතුළත් ගැමි ගායනා අංගයකි.

i. නෙළුම් ඕසේ ii. බඹර ගී iii.ගැල් ගී iv. නෙළුම් සිංදුව


v. ටීකා සීපද ( )

25. නූර්ති නාට්‍යයට සංගීතය සැපයූ සංගීතඥයින් පමණක් ඇතුළත් පිළිතුර වනුයේ,

i. ජයා ශංකර්, විශ්වනාත් ලෞජි ii. විශ්වනාත් ලෞජි, අලගුණායිදු iii.නාරසිංහ, ගණිතාලංකාර

iv.ජයා ශංකර්, ගණිතාලංකාර v. අලගුණායිදු, ජයා ශංකර් ( )

❖ **අංක 26 සිට 28 දක්වා ප්‍රශ්නවලට පහත ස්වර පුවරුව ඇසුරෙන් පිළිතුරු සපයන්න.**




26. ඉහත ස්වර පුවරුවෙහි අංක 8, 11, 15 ට අයත් කෝඩ් ( Chord ) එක වනුයේ,

    i. F Major   ii. C Minor   iii. F Minor   iv.C Major

    v.G Major ( )

27. වයලීනයේ තත් සුසර කරනුයේ අපරදිග ක්‍රමයට අනුව අංක

    i. 3, 8, 15, 20   ii.1, 3, 10, 15   iii. 3, 10, 17, 24   iv. 8, 12, 15, 19

    v. 3, 8, 13, 17 ( )

28. අංක 8, 10, 11, 13, 15, 16, 18, 20 යන ස්වර අයත් හින්දුස්ථානි ථාටය වනුයේ,

    i. බිලාවල් ථාටය   ii. කාෆි ථාටය   iii. ඛමාජ් ථාටය   iv. කළ්‍යාණ ථාටය

    v. ආසාවරී ථාටය ( )

29. 'සංගීත සංහිතා' කෘතිය රචනා කළේ,

    i. වින්සන්ට් සෝමපාල මහතා ය.   ii. ඩබ්.බී. මකුළොලුව මහතා ය.   iii. සී.ද. ඇස් කුලතිලක මහතා ය.

    iv. විමල් අභය සුන්දර මහතා ය.   v. එදිරිවීර සරත්චන්ද්‍ර මහතා ය. ( )

30. හින්දුස්ථානි සංගීතයේ දී කූට තාන් හඳුන්වන තවත් නාමයකි.

    i. වක්‍ර තාන්   ii. සරල තාන්   iii. සපට් තාන්   iv. අලංකරික තාන්

    v. බෝල් තාන් ( )

❖ **අංක 31 සිට 50 දක්වා ප්‍රශ්නවලට අදාල කෙටි පිළිතුර හිස්තැන තුළ ලියා දක්වන්න.**

31. පෙරදිග සංගීතයේ හා අපරදිග සංගීතයේ ප්‍රධානම සිද්ධාන්තමය වෙනස වන්නේ පිළිවෙළින්, .................................................................... හා .................................................................... ය.

32. **තිරිකිට** යන තබ්ලා පදය දෙවරක් වැයෙන තාල යුගලය .................................................................... හා .................................................................... වේ.

33. සරල ශාස්ත්‍රීය ගායන ශෛලියක් වන ගසල් ගායන ශෛලිය හා බැඳුණු නාමයන් දෙකකි. .................................................................... හා .................................................................... ය.

34. සංගීතය පටිගත කිරීම සඳහා යොදා ගන්නා මෘදුකාංග දෙකකි. .................................................................... හා .................................................................... ය.

35. ............................................................ සබරගමු ශාන්තිකර්ම ගී පාදයක් වන අතර, එම සම්ප්‍රදායේ යොදා ගන්නා ප්‍රධාන අවනද්ධ භාණ්ඩය .................................................................. වේ.

36. කෝලම් රංග සම්ප්‍රදායේ චරිත හඳුන්වා දෙන්නේ ........................................................ වන අතර නාඩගම් රංග සම්ප්‍රදායේ චරිත හඳුන්වා දෙන්නේ ........................................................ චරිතයයි.

37. මෙහෙ ගී අනාසාතාත්මක වීමට හේතු දෙකකි. .................................................................... හා ....................................................................

38. ක්‍රමික් පුස්තක් මාලිකා ග්‍රන්ථය ................................................ පඬිතුමා විසින් ද සංගීත රත්නාකරය ................................................ පඬිතුමා විසින් ද රචනා කරන ලදී.

39. මුල්ම සිංහල නාඩගම් නාට්‍යය ............................................................ වන අතර, එය රචනා කරන ලද්දේ ............................................................ විසිනි.

40. අපරදිග සංගීතයේ මාත්‍රා දෙකක වටිනාකම .........................................නමින් හඳුන්වනු ලබන අතර, ♩. හී වටිනාකම මාත්‍රා ...................................... කි.

41. ගැමි ගී තුළ සාමූහික බව දනවන ගී වර්ගයක් ලෙසට ................................................ ද දාර්ශනික බව පෙන්වන ගැමි ගීතයක් ලෙසට ........................................................ දැක්විය හැකිය.

42. සුසර කිරිම අතින් සමාන උතුරු ඉන්දීය සංගීත භාණ්ඩ යුගලයකි. ................................................ හා ............................................................

43. තබ්ලා වාදනයේ දී දෑතම යොදාගෙන වාදනය කරන අක්ෂරයක් ලෙසට ............................................ අක්ෂරය ගත හැකි අතර, ............................................... අක්ෂරය දයාං කොටසින් උපදින ශුද්ධ අක්ෂරයකි.

44. xxxxx| xx| xxx| xxxx| ලෙසට මාත්‍රා බෙදෙන හින්දුස්ථානි තාලය ........................................... නම් වන අතර, එම තාලය වාදනය කරන්නේ .......................................... කි.

45. රාගයක ප්‍රධාන රාග ජාති .................................... ක් වන අතර නැවත එයින් රාග ජාති .................................. ක් සෑදේ.

46. නෙළුම් ගායන ශෛලිය ..................................... හා ..................................... ලෙස ප්‍රභේද දෙකකි.

47. උත්තර භාරතීය සංගීත පද්ධතියේ ස්වර නාම ......................................... වන අතර දක්ෂිණ භාරතීය සංගීත පද්ධතියේ ස්වර නාම ........................................ කි.

48. ලතින් ඇමෙරිකානු සංගීතය හා බැඳි පවතින තාල රටා දෙකකි. .............................. හා .............................. ය.

49. තබ්ලා වාදනයක යෙදෙන ශිල්පීය අංග දෙකකි .................................................. හා ................................................

50. භාරතයේ සුප්‍රකට වයලීන් වාදකයෙකු හා සිතාර් වාදයෙකු ලෙස පිළිවෙලින් ....................................... ..........................., ................................................................ නම් කළ හැකි ය.

පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

පෙරදිග සංගීතය II

# තෙවන වාර පරීක්ෂණය - 2023

## 12 ශ්‍රේණිය

| 54 | S | II |
|---|---|---|

පැය තුනයි

අමතර කියවීම් කාලය මිනිත්තු 10 යි

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

විභාග අංකය : ..................................

## II පත්‍රය

උපදෙස් :

❖ I කොටසින් ප්‍රශ්න දෙකක් ද, II කොටසින් ප්‍රශ්න එකක් ද, III ප්‍රශ්න දෙකක් ද බැගින් ප්‍රශ්න පහකට පමණක් පිළිතුරු සපයන්න.

## I කොටස

01. A,B,C වලින් දක්වා ඇත්තේ නිර්දේශිත රාග තුනක තොරතුරුය.

**A**
- ආරෝහණයේ ධ (ධෛවතය) ස්වරය නොයෙදේ
- ප (පංචමය) සංවාදී වේ.

**B**
- ධෛවතය (ධ) ස්වරය කෝමල වේ.
- ආරෝහණය ඖඩව ජාතිවේ

**C**
- ධ ම මීන්ඩ් වේ.
- පංචමය ආගන්තුක වේ.

i. A,B,C රාග නම් කරන්න. (ල.3)

ii. A හෝ C රාගයට අයත් **මධ්‍යලය ගීතයක ස්ථායි කොටස** ගීත ස්වර ප්‍රස්තාර කරන්න.

නැතහොත්

මධ්‍යලය **වාදිතයක ස්ථායි කොටස** ස්වර ප්‍රස්තාර කර මාත්‍රා **අටකට** නොඅඩු **තානාලංකාර** දෙකක් තාලානුකූලව ප්‍රස්තාර කර දක්වන්න. (ල.6)

iii. B රාගය හා සමප්‍රකෘති වන රාගය නම් කර එම රාග දෙක අතර සමවිෂමතා ගොනුවක් සකසන්න. ( ල.6 )

iv. රාගයක යොදා ගන්නා **මීන්ඩ්, ගමක්, ඛන්, උපජ්, මූර්කි** යන ශිල්පීය අංග කෙටියෙන් හඳුන්වන්න. (ල.5)

02. පහත දක්වා ඇත්තේ නිර්දේශිත හින්දුස්ථානි තාල කිහිපයක් හා සම්බන්ධ තොරතුරු ය.

A. | ම ම ප ස̇ | <u>ධ</u> - ප - | <u>ධ</u> ම ප <u>ධ</u> ම ප | <u>ග</u> - රි ස | යන මධ්‍යලය ස්වර පාදය සඳහා භාවිත වන තාලයකි.

B. ධ්‍රැපද් ගායනය සඳහා යොදා ගැනෙන තාලයකි.

C. විශේෂයෙන් භජන්, ධූන් වැනි ගායන, වාදන ශෛලීන් සඳහා යොදා ගැනෙන මෙම තාලය මාත්‍රා 16කි.

D. X 2 0 3 වශයෙන් තාල සංඥා යොදා ගැනෙන මෙම තාලය විලම්භලය ඛ්‍යාල් ශෛලිය සඳහා යොදා ගනියි.

i. A,B,C,D තාල නම් කරන්න. ( ල.4 )

ii. A හී දක්වා ඇති ස්වර පාදයට අයත් රාගයට අදාළ **මාත්‍රා 8** කට නොඅඩු **තානාලංකාර 2** ක් තාලානුකූලව ප්‍රස්තාර කර දක්වන්න. ( ල.5 )

iii. B තාලය **සමගුණ හා දෙගුණ** වශයෙන් ප්‍රස්තාර කර දක්වන්න. ( ල.6 )

iv. A හා D තාලය දෙක අතර ඇති සම විෂමතා කරුණු වශයෙන් ලියා දක්වන්න. ( ල.5 )

03. පහත දක්වා ඇත්තේ හින්දුස්ථානි ගායන ශෛලීන් කිහිපයකට අදාළ තොරතුරුය.

a. සෘතු වර්ණනා, රාධා ක්‍රිෂ්ණා පිළිබඳ වර්ණනා වේ.

b. ආදරය, විරහව, වස්තු විෂය කර ගනී.

c. ඉපැරණිම ගායනා ශෛලියක් වන මෙය සාරංගදේව හා රජාමාංසිං තෝමර් නාමයන්ට බැඳී ඇත.

d. ප්‍රභේද දෙකකින් යුතු ය.

e. මධ්‍යලයෙන් ඇරඹී ද්‍රැත ලයෙන් අවසන් කරයි.

f. දෙවියන්ගේ ගුණ වර්ණනා වේ.

i. ඉහත a සිට f දක්වා කරුණුවලට අදාළ ගායන ශෛලීන් පිළිවෙළින් නම් කරන්න. ( ල.3 )

ii. a හා c ගායන ශෛලන් අතර ඇති සම විෂමතා ගොනුවක් සකසන්න. ( ල.6 )

iii. ඉහත දක්වා ඇති b ගායන ශෛලිය පිළිබඳව විස්තරයක් කරන්න. ( ල.6 )

iv. d ගායන ශෛලිය සඳහා යොදා ගන්නා තාලයක් නම් කර එම තාලයේ **ආවර්තයකට** ගැළපෙන ලෙස **භාගේශ්‍රී** රාගයේ **මුඛ්‍යාංග** ස්වර ලියාදක්වන්න. ( මුඛ්‍යාංග ස්වර පිළිවෙළින් තිබිය යුතු අතර, එක් ස්වරයක් යොදා ගත හැක්කේ එක්වරක් පමණි. ) ( ල.5 )

## II කොටස

04. ශ්‍රී ලාංකීය රංග ශෛලීන් හතරකට අදාළ තොරතුරු පහත වගුවෙන් දක්වා ඇත.

| | රංග ශෛලිය | තාල වාද්‍ය භාණ්ඩය | සංගීත අභ්‍යාස | රඟ දැක්වූ ස්ථානය |
|---|---|---|---|---|
| A | නාඩගම් | අ) .......................... | ආ) .......................... | කරලිය |
| B | ඇ) .......................... | තබ්ලාව | ඈ) .......................... | වේදිකාව |
| C | සොකරි | ඉ) .......................... | උඩරට ශාන්තිකර්ම ගීතනු අභාසය | ඊ) .......................... |
| D | උ) .......................... | යක් බෙරය | ඌ) .......................... | තානායම්පොල |

i. ඉහත වගුවෙහි හිස්තැන් සඳහා වඩාත් සුදුසු පිළිතුරු ලියා දක්වන්න. ( ල.4 )

ii. B රංග ශෛලියේ **සංගීතමය ලක්ෂණ** ලියා දක්වන්න. (වගුවෙහි ඇතුළත් තොරතුරු හැර)( ල.6 )

iii. C සොකරි රංග ශෛලියට අයත් ගීතයක **මුල් පාද දෙක** ගීත ස්වර ප්‍රස්තාර කරන්න.( ල.4 )

iv. ගෝත්‍රික ගීත වශයෙන් ''වැදි ගීයේ ස්වභාවය'' පිළිබඳ එහි **සංස්කෘතිකමය** හා **සංගීතමය** ලක්ෂණ ඇසුරින් පැහැදිලි කරන්න. ( ල.6 )

05. ශ්‍රී ලාංකීය ජන ගීතය ගැමි ගී හා සේ ගී වශයෙන් කොටස් දෙකකි.

i. ගැමි ගී නිර්මාණයට පදනම් වූ ප්‍රධාන හේතු සාධක කවරේ ද? උදාහරණ දෙමින් පැහැදිලි කරන්න. (ල.6)

ii. දේශීය තාල පද්ධතියට අනුව **දෙතිතේ** ප්‍රභේද නම් කර ඉන් **එක් තිත් රූපයක්** තිත් සංඥා සහිතව ප්‍රස්තාර කර දක්වන්න. ( ල.6 )

iii. ආසාතාත්මක ගී, අනාසාතාත්මක ගී යන්න හඳුන්වා එම ගී වර්ග දෙක සඳහා උදාහරණ **ගීත පාද දෙකක්** ගීත ස්වර ප්‍රස්තාර කර දක්වන්න. ( ල.6 )

iv. ශාන්තිකර්ම ගීතවල **සංගීතමය ලක්ෂණ** හතරක් ලියා දක්වන්න. ( ල.2 )

## III කොටස

06. ලෝකයේ මහා සම්ප්‍රදායේ එන සංගීත සම්ප්‍රදායන් පහකි.


i. ගම්ලැන් සංගීත පද්ධතියේ සුවිශේෂි ලක්ෂණ හතරක් දක්වන්න. ( ල.4 )

ii. පෙරදිග හා අපරදිග සංගීත පද්ධතීන් අතර ඇති වෙනස්කම් පිළිබඳව කරුණු වශයෙන් විස්තරයක් කරන්න. ( ල.5 )

iii. උත්තර භාරතීය හා දක්ෂිණ භාරතීය සංගීත පද්ධතිවල **වෙනස** ලියා දක්වන්න. ( ල.6 )

iv. ශාස්ත්‍රීය පදනමක් සහිත සරල ගීත (සරල ශාස්ත්‍රීය ගී) දෙකක් නම් කර ඉන් එක් ගීතයක් පිළිබඳව විචාරයක් කරන්න. ( ල.5 )

07. පිළිතුරු සපයන්න.




i. ඉහත අපරදිග ප්‍රස්තාරයට අදාළ Time Signature යොදන්න. ( ල.2 )

ii. එම ප්‍රස්තාරය පෙරදිග සංගීත ක්‍රමයට පෙරළා ප්‍රස්තාර කරන්න. ( ල.8 )

iii. එම ප්‍රස්තාරය අයත් ස්කේලය ( scale ) නම් කර **scale ස්වර** ලියා දක්වන්න. ( ල.3 )

iv. ඉහත අපරදිග ප්‍රස්තාරයේ අංක 1, 2, 3, 4 දක්වා ඇති සංකේත නම් කරන්න. ( ල.4 )

v. C Minor, G Major, F Major chord ස්වර ලියා දක්වන්න. ( ල.3 )

08. පහත දක්වා ඇති මාතෘකා අතුරින් හතරක් තෝරාගෙන විස්තර කරන්න.

i. ශ්‍රී ලංකාවේ මුල් යුගයේ නිර්මිත අධ්‍යාපනික **ග්‍රන්ථ** හා **කතුවරුන්**

ii. කවිකාර මඩුව

iii. සංගීත අධ්‍යාපනය සඳහා අන්තර්ජාල භාවිතය

iv. භාරතීය සංගීතයේ වර්ධනයට ඉවහල් වූ **වෛදික යුගය.**

v. අපරදිග හඬතල භාවිතය

( ල.5 x 4 = 20 )

# 2023 තෙවන වාර පරීක්ෂණය

## 12 ශ්‍රේණිය - පෙරදිග සංගීතය

## පිළිතුරු - I පත්‍රය

| | | |
|---|---|---|
| 1. - II | 11. - II | 21. - II |
| 2. - I | 12. - III | 22. - I |
| 3. - III | 13. - IV | 23. - III |
| 4. - V | 14. - I | 24. - V |
| 5. - II | 15. - V | 25. - I |
| 6. - I | 16. - II | 26. - II |
| 7. - IV | 17. - IV | 27. - III |
| 8. - II | 18. - III | 28. - V |
| 9. - III | 19. - V | 29. - IV |
| 10. - V | 20. - I | 30. - I |

31. Melody - Harmony ( ඒක නාද - බහු නාද )

32. ඒක්තාලය - තිලවාඩා තාලය

33. ජග්ජිත් සිං/ චිත්‍රා සිං / පන්කජ් උදාස් / ගුලාම් අලී ....

34. Adobe Audition / Sony Acid / Cubase /Sound Forge / Protools / Streinberg Nuendo

35. ගුණ දැනේ බෝසත් අනේ / සුද්ධෝදන රජුට දාව උපන් / සොඳින් හඬනගා / හිස මුව තුළ බෙල්ල දෙවුර / දවුල

36. සබේ විදානේ - පොතේ ගුරු

37. කාර්යානුබද්ධ වීම / ඒකල ගායනය වීම / ක්ෂණික නිර්මාණ කර ගැයීම ආදී හේතූන්

38. භාත්ඛණ්ඩේ පඬිතුමා - සාරංගදේව පඬිතුමා

39. අහැලේපොළ ( සිංහලේ නාඩගම ) - පිළිප්පු සංක්‍යෝ

40. මිනිම් ( Minim ) - මාත්‍රා 3 කි.

41. ගොයම් ගී / නෙළුම් ගී / කමත් ගී -
    පැල් ගී - වෙල් යායක ගොස් දෙන්නෙක් ...
    ගැල් ගී - තණ්ඩලේ දෙන්නා දෙපොලේ .... ආදී දාර්ශනික බව දැනවෙන ගැමි ගී .....

42. සිතාර් - එස්රාජ්

43. ධා / ධිං /ධි - න /තා/ තිට / තිං / තුං / ති

44. ධමාර් තාලය - පක්වාජයෙනි

45. 3 ක් - 9 ක්

46. නෙලුම් ඕසය - නෙලුම් සිංදුව

47. 12 - 16 කි.

48. රෙගේ /සල්සා / සම්බා .... ( Reggae / Salsa / Samba )

49. පරන් / ගත් / මුකඩා /රේලා / කායදා / පල්ටා / තිහායි / චක්‍රදාර්

50. වයලීන් - වී.ජේ. ජෝග් / එන්. රාජම් / වී. බාලාජි ....
    සිතාර් - රවි ශංකර් / නිකිල් බැනර්ජි / විලයාත් ඛාන්


LOL.lk
BookStore
විභාග ඉලක්ක
පහසුවෙන් ජයගන්න
ඕනෑම පොතක් ඉක්මනින්
නිවසටම ගෙන්වා ගන්න
| කෙටි සටහන් | පසුගිය ප්‍රශ්න පත්‍ර | වැඩ පොත් | සඟරා | O/L ප්‍රශ්න පත්‍ර
| A/L ප්‍රශ්න පත්‍ර | අනුමාන ප්‍රශ්න පත්‍ර | අතිරේක කියවීම් පොත්
| School Book | ගුරු අත්පොත්
pesuru Prakashana Private Ltd.
Akura Pilot
සමනල දැනුම
සතර
පෙර පාසලේ සිට උසස් පෙළ දක්වා සියළුම ප්‍රශ්න පත්‍ර,
කෙටි සටහන්, වැඩ පොත්, අතිරේක කියවීම් පොත්, සඟරා
සිංහල සහ ඉංග්‍රීසි මාධ්‍යයෙන් ගෙදරටම ගෙන්වා ගැනීමට
www.LOL.lk වෙබ් අඩවිය වෙත යන්න